# ළමා ශ්‍රමයට තිමාවක්



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## සමනළ ළමා ලොව



රටේ ජීවනාලිය ළමා පරපුරයි. එකී ළමයා යහපත් පුරවැසියකු බවට පත්වන සෞභාග්‍යමත් සංහිඳියාවකින් යුතු ජාතියක් වශයෙන් නැගී සිටීමට, මූලිකවම දැයේ දරුවන් ආරක්ෂා කිරීම සිදු කළ යුතුය. ඒ සඳහා ඔවුන් කායිකව හා මානසිකව සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ අයිතින් සුරක්ෂිත කළ යුතුය. එය අප සැමගේ පරම යුතුකම මෙන්ම වගකීම ද වේ.

## ළමා ශ්‍රමිකත්වය........

එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේද ළමා ශ්‍රමය පිළිබඳව සඳහන් වේ. ඒ “ආර්ථික වශයෙන් සූරා කෑමෙන් සහ අවදානම් වැඩ කිරීමෙන් ළමයා ආරක්ෂා කළ යුතු බවත්, ළමයාගේ සෞඛ්‍යයට හෝ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරත්මක හෝ සමාජ සංවර්ධනයට හානි කරවන යම් ක්‍රියාවකින් ආරක්ෂා කළ යුතුය” යනුවෙනි.



## ළමා ශ්‍රමිකයකු වන්නේ,

- ළමයින් විවිධ ලෙස සේවයේ යෙදවීම.
- නිතිපතා හෝ දීර්ඝ කාල වේලාවන්හි වැඩෙහි යෙදවීම.

පුද්ගලයෙකුගේ පෞරුෂ වර්ධනයේ වැදගත්ම කාලය ළමා කාලය වන බැවින් ළමයා ශ්‍රමිකයෙකුවීමෙන් ආරක්ෂා කරගැනීම අනිවාර්ය කරුණකි.

## ළමා ශ්‍රමය ක්‍රියාත්මක වන ආකාරය

ශ්‍රී ලංකාව තුළ ළමුන් වැඩි වශයෙන් සේවයේ යොදවා ගනු ලබනුයේ ගෘහාශ්‍රිතව සහ ව්‍යාපාර ආශ්‍රිතවය. එමෙන්ම මෑත කාලයේදී මත්ද්‍රව්‍ය වැනි තහනම් භාණ්ඩ ප්‍රවාහනය සහ ළමුන්ව ලිංගික කටයුතු සඳහා ජාවාරම් කිරීමට අදාල සිදුවීම් පිළිබඳව වාර්තාවීම කණගාටුවට කරුණකි.

## ළමා ශ්‍රමිකත්වයේ භයානක තත්වය

මෙහි ඇති භයානක තත්වය වන්නේ ළමා ශ්‍රමිකත්වයට ගොදුරුවූවන් අමානුෂික ලෙස කෲර වද හිංසාවන්ට ලක්වීම, ඔවුන්ගේ අධ්‍යාපනය බිඳවැටීම, පෞරුෂ සංවර්ධනය අඩාලවීම, විවිධ අපයෝජනයන්ට ගොදුරුවීම සහ වින්දිතයන් බවට පත්වීමෙන් සමාජයට වෛර කරන පුද්ගල කොට්ඨාසයක් බිහිවීමය.

## ළමුන් රැකියාවල නිරත කරවීම නිතියට අනුව වරදක්.

නිතියට අනුව කිසිදු අයුරකින් අවුරුදු 14 ට අඩු ළමයින් රැකියාවක යෙදවිය නොහැක. එලෙස යොදවන පුද්ගලයින්ට එරෙහිව මාස 12 ක සිර දඬුවම් ලබාදිය හැක.

අවුරුදු 14 ත් 18 ත් අතර දරුවන් සමහර අවස්ථාවල සේවයේ යෙදවිය හැකි නමුත් ඔවුන්ගේ ජීවිතයට, සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සදාචාරයට මෙන්ම ශාරීරිකව හෝ මානසිකව හානි ගෙනදෙන අනතුරුදායක රැකියාවල යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම්ය.



(පලිබෝධනාශක, රසායන ද්‍රව්‍ය, ගිනිකෙළි, වානේ උණුකිරීම්, පතල් කැනීම් ,ගල් කැඩීම්, ගස් නැගීම හා කැපීම, දර කැපීම, කැලිකසළ ප්‍රවාහනය, ආදි කටයුතු මෙන්ම ගිනි බෝල කරකැවීම, කරණම් ගැසීම ආදි කටයුතුවල යෙදවීම තහනම්ය).

එම වරදට වරදකරුවන සේවායෝජකයින්ට රු. 10000/- දඩයක්, මාස 12 ක සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙකම සමඟ හිංසනයට පත් ළමයාට අධිකරණයේ අභිමතය පරිදි වන්දි මුදලක්ද නියම කළ හැක.



## ළමා ශ්‍රමිකත්වය පිටු දැකීමට ඒකරාශිවීම

නූතන සංකීර්ණ සමාජ ප්‍රවාහය තුළ සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීමේ භාරදූර කර්තව්‍යය සමාජයීය වශයෙන් ප්‍රබල අභියෝගයක්ව පවතියි. මෙම අභියෝගය ජය ගැනීමට සමස්ත සමාජයම ඒකරාශිවිම අත්‍යවශ්‍ය වේ.





ළමා ශ්‍රමිකත්වය පිළිබඳ දැනගත් විගසම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුලු පහත ආයතන වෙත දැනුම් දෙන්න.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**
අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර.
දුරකථන - 011 2778911 - 12 - 14
ෆැක්ස් - 011 2778915
විද්‍යුත් තැපෑල -
ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය - www.childprotection.gov.lk

**කම්කරු දෙපාර්තමේන්තුව**
(කාන්තා හා ළමා කටයුතු අංශය)
කම්කරු මහලේකම් කාර්යාලය
නාරාහේන්පිට
කොළඹ 05
දුරකථන - 0112 553 791
0112 369 297
0112 369 800
0112 587 315

**ශ්‍රී ලංකා පොලිසිය**
ක්ෂණික ඇමතුම් - 119